# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට

# පුරවැසි

# අදහස් හා යෝජනා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය

அரசியலமைப்பு மாற்றத்திற்கான பிரஜைகளின் முயற்சி

Citizens' Initiative for Constitutional Change

# හැඳින්වීම

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය' යහපත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීම සඳහා මහජන අදහස් විමසීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ව්‍යවස්ථා සම්පාදන කතිකාව ආරම්භයේ සිටම කැපවිණ. ඒ අනුව විවිධ සාකච්ඡා, සංවාද ඔස්සේ මහාජන අදහස් හා යෝජනා ලබා ගැනීම අඛණ්ඩව සිදු කරනු ලැබිණි. ලංකාවේ විවිධ ප්‍රදේශවල සංචාරය කරමින් හැකි සෑම අයුරින් ම පුරවැසියා මුණ ගැසුණු අතර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ඔවුන් දැනුවත් කරමින් ඔවුන්ගේ වටිනා අදහස් හා යෝජනා ලබා ගැනුණි.

එසේ ම මේ සඳහා උනන්දුව දක්වන ලද පුරවැසියන් බොහෝ ප්‍රමාණයක් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය' වෙත තැපැල් හා විද්‍යුත් තැපෑල මාර්ගයෙන් ලිඛිතව ද අදහස් හා යෝජනා එවන ලදී.

ඒ අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් විය යුත්තේ කෙසේ ද කියා, දිවයිනේ විවිධ ප්‍රදේශවලින් එවන ලද මහජන අදහස් හා යෝජනා වලින් සමන්විත වාර්තාව මෙසේ සැකසුණි.

මෙම මහජන අදහස් හා යෝජනා 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව විසින් ඔවුන්ගේ යෝජනාවලිය සහ නිර්දේශයන් සම්පාදනය කිරීම සඳහා ලබා ගනු ඇතැයි අප විශ්වාස කරමු.

**- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය**

## ප්‍රස්ථාවනාව

1. ශ්‍රී ලංකාවේ ඇති බහු සංස්කෘතික බහුත්වවාදය, දේශපාලන බහුත්වවාදය පිළිගත යුතුය.

2. නීතියේ ආධිපත්‍ය, බලතල බෙදීම හා මානව ගරුත්වය ආරක්ෂා වන පරිදි ව්‍යවස්ථාවේ ඇති සියලු විධිවිධාන ක්‍රියාත්මක විය යුතුය.

3. ශ්‍රී ලංකාව කිසිඳු ආගමකට හෝ ජාතියකට විශේෂ සැළකිල්ලක් හෝ වරප්‍රසාදයක් නොදක්වන අනාගමික රාජ්‍යක් ලෙස ව්‍යවස්ථාවෙන් පිළිගතයුතුය. මෙසේ පිළිගත නොහැකි නම් බෞද්ධ ධර්මය, කිස්තියානි ආගම, හින්දු ආගම, ඉස්ලාම් ආගම හෝ වෙනත් ආගම් සමසේ සලකන ලෙස ද, කිසිදු ආගමක් ඇදහීමට අවශ්‍ය නොවන පුද්ගලයන්ට ද සමසේ සැලකිය යුතුය.

## විධායක ජනාධිපති ක්‍රමය සහ රටේ පාලනය සම්බන්ධව

1. මේ යටතේ අගමැති විධායකයක් පත් කිරීම නොව අගමැති ප්‍රමුඛව සමස්ත කැබිනට් මණ්ඩලයටම විධායක බලය ලැබෙන සේ මෙය සිදු වියයුතු බවයි.

2. ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා ලෙස පමණක් පිළිගත යුතු අතර ඔහු හෝ ඇය පත්විය යුත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත ඡන්දදායක විද්‍යාලයකිනි.

3. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් අපක්ෂපාතීව ක්‍රියා කළ යුතුය.

4. ජනාධිපතිවරයා සක්‍රීය ලෙස කිසිදු දේශපාලන පක්ෂයක ක්‍රියා නොකළ යුතුය.

5. ජනාධිපතිවරයා ජාතික සංහිඳියා කොමිසමේ නායකත්වයට පත් විය යුතුය.

6. ස්වාධීන කොමිෂන් සභා ගණන වැඩිකළ යුතු අතර එම කොමිෂන් සභාවන්හි බලතල පුළුල් කළ යුතුය. එසේම මෙම කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකියන ලෙසට ප්‍රතිපාදන සකස් කළ යුතුය. උදා:- රාජ්‍ය සැලසුම් කොමිසම, අධ්‍යාපන කොමිසම, විශ්ව විද්‍යාල කොමිසම, සෞඛ්‍ය කොමිසම,පාරිසරික කොමිසම, කාන්තා කොමිසම,ළමා කොමිසම සහ ආබාධිත කොමිසම.

7. රාජ්‍ය මාධ්‍ය ස්වාධීන කළ යුතුය. මේ සම්බන්ධව මාධ්‍ය කොමිසමක් ස්ථාපිත කළයුතු අතර රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍යන්හි හැසිරීම සම්බන්ධව මාධ්‍ය

ප්‍රධානීන් සහ මාධ්‍යකරුවන් සමඟ පුළුල් සංවාදයක් ඇති කළ යුතු අතර මේ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

8. සංහිඳියාව හා භාෂාව සම්බන්ධයෙන් ස්ථිරසාර කොමිසමක් පත්කළ යුතුය. එමගින් ගැටලු අධ්‍යනය, ඊට කතිකාවක් ගොඩ නැගීම හා මේ සම්බන්ධව රජයට උපදෙස් දීමට හැකිවන පරිදි එය සකස් විය යුතුය. මෙම කොමිසම ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් ක්‍රියාත්මකවිය යුතුය.

9. යහපාලනය සුරැකීමට හා සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ජනාධිපතිවරයාට ප්‍රධාන අධිකාරයක් පැවතිය යුතුය.

10. කාන්තාවන් හා ළමුන් වෙනුවෙන් විශේෂ කොමිසමක් පත් කළ යුතුය.

11. අමාත්‍යාංශ ලේකම්වරුන්,රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් සහ තානාපති නිලධාරීන්පත් කිරීමේදී නියමිත විභාග සමත් වී ඔවුන් සතු විශේෂ සුදුසුකම් මත අදාළ පත් කිරීම් පාර්ලිමේන්තු කාරක සභාවක් තුළින් යෝජනා වී පත්කළ යුතුය.

12. අමාත්‍යවරුන් සහ මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට (මහජන මුදල් වලින් නඩත්තු කරන) තම ඥාතීන් ඇතුළත් කරගැනීම තහනම් කළ යුතුය.

13. විද්‍යාත්මක බෙදීමක් මත අදාළ විෂයන් සහිතව නිශ්චිත අමාත්‍යාංශ සංඛ්‍යාවක් පත්කළ යුතුය. ඒ සඳහා නිර්ණායක ස්ථාපිත කළ යුතුය. කැබිනට් අමාත්‍ය ධූර 25 කට සීමා කළයුතු අතර නියෝජ්‍ය අමාත්‍යධූර 25 නොඉක්මවිය යුතුය. කැබිනට් අමාත්‍යවරුන් ලෙස කාන්තාවන් 6ක් වත් පත්විය යුතුයි.

14. මහජන අදහස් පදනම් කර ගනිමින් නීති සම්පාදනය කළ යුතුය. මෙහිදී යම්කිසි නීතියක් සකස් කිරීමට මාස තුනකට පෙර මහජන අදහස් කැඳවා එය සකස් කළ යුතු අතර එය ගැසට් පත්‍රයේ පළ කල පසු දින 14 ක කාලයක් සඳහා නැවත මහජන අදහස්වලට යොමු කළ යුතුය.

15. දේශපාලන වශයෙන් පිල් මාරුවීම තහනම් කළ යුතු අතර පිල් මාරුවන දේශපාලනඥයින්ව ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමය යටතේ නැවත කැඳවීමට මහජනතාවට හැකිවිය යුතුය.

16. දේශපාලන පක්ෂවල අරමුදල් විගණනයට යටත් කළ යුතු අතර එම මුදල් ලැබීම් හා ගෙවීම් යනාදිය ඇතුළු අනෙකුත් කාරණා මැතිවරණ කොමිසම මගින් සළකා බැලිය යුතුය.

17. පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට විධිවිධාන සකස් කළ යුතුය.

18. මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්යමණ්ඩල සේවයට ඔහුගේ/ඇයගේ ඥාතීන් සම්බන්ධ නොකරගත යුතුය. එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සීමා කළ යුතුය.

19. ව්‍යවස්ථාව සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීමට ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවිය යුතුය.

20. පාර්ලිමේන්තුව ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායකයක් විය යුතු අතර දෙවන මන්ත්‍රී මණ්ඩල පළාත් බද නියෝජිතයන්ගෙන් විද්වතුන්ගෙන් හා සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත විය යුතුය.

21. ''පුරවැසි සභා'' යනුවෙන් නම් කරන ලද බිම් මට්ටමේ ප්‍රජාතන්ත්‍රීය යාන්ත්‍රණයන් ස්ථාපිත කළ යුතුය. සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකටම එක් පුරවැසි සභාවක් පත්කළ යුතුය. එම කොට්ඨාශයේ ජීවත්වන පුරවැසියන් හට බලපාන ගැටලු සම්බන්ධයෙන් ජනතා නියෝජිතයින් දැනුවත් කිරීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පුරවැසි සභා හට බලය ලබාදිය යුතුය.

❖ ග්‍රාමීය මට්ටමින් සිදුවන සංවර්ධන ක්‍රියාවලීන් පිළිබඳ පුරවැසියාට තීන්දු තීරණ ගැනීමට හැකි ග්‍රාමීය මට්ටමේ යාන්ත්‍රණයක් ලෙස **පුරවැසි සභා** හැඳින්විය හැකි ය.

❖ කුමන සංවර්ධන සැලසුම් ඉදිරිපත් කළත් ඒවා පල නොදරන තත්ත්වය හේතුවෙන් වඩාත් යහපත් ව සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක කර ගැනීම සඳහා පුරවැසි සභා නිර්මාණය කළ යුතු ය.

❖ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන පරිපාලනමය හා සංවර්ධන කටයුතු කුමන ව්‍යුහයක් යටතේ ක්‍රියාත්මක වුව ද, ඒවා 'ගම' නැමති ඒකකය මුල් කර ගනී. මෙහි දී පාර්ශ්වයන් තුනක් ක්‍රියාත්මක වේ. එනම්,

- ගැමි ප්‍රජාව
- සේවා ආයතන
- රජ යි.

❖ රජය සහ ගැමි ප්‍රජාව අතර සම්බන්ධය ගොඩ නැගෙන්නේ සේවා ආයතන ඔස්සේ ය. එහෙත් මෙය නිසි පරිදි ක්‍රියාත්මක නොවන්නේ විවිධ ව්‍යාකූලතා හේතුවෙනි. ඒවා හඳුනා ගැනීම සහ අවශ්‍ය පිළියම් යෙදීමේ ශක්‍යතාවක් පුරවැසි සභාවනට පවතී.

❖ පුරවැසි සභා යනු, ගමෙහි තිබෙන විවිධ සමිති සමාගම්වල එකතුවකින් සැදුම්ලත් ඒකකයකි. **ග්‍රාම සංවර්ධන සමිති, මරණාධාර සමිති, කාන්තා සමිති, තරුණ සමිති,ගොවි සමිති,ළමා සමිති සහ ණය දෙන සමිති** ආදී නොයෙකුත් සමිති සමාගම් ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන අතර ඒ සියලු සමිති සමාගම්වල නිලධාරින් සහ නියෝජිතයන්ගේ එකතුවෙන් පුරවැසි සභා ව ගොඩ නැගේ. පුරවැසි සභාව කමිටු සහ විෂය ක්ෂේත්‍ර කොටස් පහක් ඔස්සේ විකාශනය වේ.

- යහපාලනය (යහපාලන කමිටුව)
- පරිසරය හා මිනිසා (පරිසර කමිටුව)
- කාන්තා හා ළමා (කාන්තා හා ළාමා කමිටුව)
- තරුණ නියෝජනය (තරුණ කමිටුව)
- මානව ගරුත්වය හා භාෂාව හා සංස්කෘතික විවිධත්වය (භාෂා හා සංස්කෘතික කමිටුව)

❖ පුරවැසි සභාවේ විධායක සභාවට සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික, කාරක සභා සාමාජිකයෝ, සහ උක්ත කමිටු පහට ද වෙන් වෙන් වශයෙන් සභාපති, ලේකම් පත් කරන අතර ඔවුන් විධායක සභාව නියෝජනය කරති.

❖ පුරවැසි සභාවේ උපදේශක සභාව වශයෙන් ග්‍රාම නිලධාරී, විදුහල්පති, ආගමික නායකයින්, සාම විනිසුරුවරුන් සහ විධායක සභාව විසින් යෝජනා කරනු ලබන ප්‍රභූවරුන් පත් කර ගත හැකි ය.

❖ ග්‍රාමීය සංවර්ධන සැළැසුම් සකස් කිරීම, ඒවාට අදහස් ලාබ ගැනීම සහ ඒවා නිරීක්ෂණය කිරීම යන කාරණා පුරවැසි සභාව ඔස්සේ සිදු වේ.

## බලය බෙදීම සම්බන්ධව

1. සිංහල බෞද්ධ ජනයාගේ අයිතිවාසිකම් ආරක්‍ෂා විය යුතු අතර උතුරු නැගෙනහිර පළාත් වල ඇති සුවිශේෂත්වය සලකා බලා මුස්ලිම් ජනයා ඇතුළු අනෙකුත් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ද රැකෙන ලෙස බලය බෙදීමේ ක්‍රියාවලිය සිදු විය යුතුය.

2. සමගාමීත්වය පවත්වාගෙන යමින්, පළාත් සභා විෂයන් සඳහා ක්‍රියාකිරීමට පළාත් සභාවලට වැඩි ඉඩක් ලබාදිය යුතුය.

3. මහජන මුදල් රැස්කිරීම විනිවිද ලෙසත් ප්‍රජාතාන්ත්‍රීය ලෙසත් සිදුවිය යුතුය. රජයේ මූල්‍ය ආකෘතිය ප්‍රජාතාන්ත්‍රීයකරණය කළයුතුය.

4. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඇති අඩුලුහුඩුකම්වලට පිළියම් යොදමින් බලය බෙදීමේ ගුණාත්මක වර්ධනයක් ඇතිකළ යුතුය.

5. පළාත් සභා අමාත්‍යවරු සංඛ්‍යාව 07කට වැඩි කළ යුතුය. මේ අතර කාන්තාවන් දෙදෙනෙකු ද පත්කළ යුතුය.

6. පළාත් රාජ්‍ය සේවය හා මධ්‍යම රාජ්‍ය සේවයේ ඇති විෂමතාවන් දුරු කොට එක් රාජ්‍ය සේවයක් බවට පත්කළ යුතුය. එම නිළධාරීන් තෝරා ගන්නා විධිමත් ක්‍රියා පටිපාටියක් සකස් වියයුතු අතර රාජ්‍ය සේවය දේශපාලන පත්වීම්වලින් වියුක්ත විය යුතුය.

7. මූල්‍ය කොමිසම මහ බැංකුවට හා මුදල් අමාත්‍යංශයට යටත් නොවිය යුතු අතර පාර්ලිමේන්තුවට පමණක් වග කිව යුතු වේ.

8. පළාත් ආණ්ඩුකාරවරුන් තේරීම ජනාධිපති, අගමැති, විපක්ෂ නායක, කථානායක ඇතුළත්වන කමිටුවකින් සිදුකළ යුතුය. ආණ්ඩුකාරවරුන්ගේ බලය සීමා කොට ජනතා නියෝජිතයන්ට වැඩි බලතල පැවරිය යුතුය.

9. පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජිතයන්ගෙන් සමන්විත, විවිධ විෂයන් ආවරණය වන පරිදි කමිටු සකස්විය යුතුය. උදා: අධ්‍යාපනය, සෞඛ්‍ය හා කාන්තා. පළාත් සභාවල හා පළාත් පාලන ආයතන වල ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් සහ පුරවැසි සහා සාමාජිකයින්ගෙන් මෙම කමිටු සමන්විත විය යුතුය.

10. පළාත් පාලන ආයතන පූර්ණ වශයෙන් පළාත් සභා යටතට අයත් විෂයක් ලෙස සැලකිය යුතු අතර හැකිතාක් දුරට මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාවල හැසිරවීමට යටත් නොවිය යුතුය.

## මූලික අයිතිවාසිකම් සම්බන්ධව,

1. මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය අන්තර්ජාතක සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ ඇති මට්ටමටවත් බලසම්පන්න කළයුතුය.

2. ජීවත් වීමේ අයිතිය, අධ්‍යාපනයට ඇති අයිතිය, සෞඛ්‍යට ඇති අයිතිය මූලික අයිතිවාසිකම් ලෙස පිළිගත යුතු අතර තොරතුරු දැන ගැනීමේ අයිතිය පුළුල් කළ යුතුය.

3. විශේෂ අවස්ථාවල දී ගබ්සාවක් සිදුකිරීමට ඇති අයිතිය පිළිගත යුතුය.

4. මානව අයිතිවාසික කඩ වීම විෂයෙහි මානව හිමිකම් කොමිසමේ බලතල ශක්තිමත් කරමින් එය බලගැන්විය යුතුය.

5. වයස අවුරුදු 16-18 අතර සිදුවන ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධව ඇති නෛතික අඩු පාඩු මග හැරවිය යුතුය. වයස අවුරුදු 18 දක්වා දරුවෙකු ලෙස පිළිගත යුතු ය.

6. සියලුම රාජ්‍ය ආයතන වල නිලධාරීන් විධිමත් ක්‍රියාවලියක් තුළින් මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත් කළයුතුය.

7. මූලික අයිතිවාසිකම් නඩු පළාත් බද මහ අධිකරණ වලදී ගොනු කිරීමට අයිතිය ලබාදිය යුතුයි.

8. සමථ මණ්ඩල තව දුරටත් බල සම්පන්න කළයුතුය.

9. රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම අඩංගු හය වැනි පරිච්ඡේදය ආහාර, නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනය ලබාදෙන බව 27 වෙනි වගනතියෙන් කියා ඇතත් එය 29 යෙන් නිශේධ කර ඇත. එනම් ඍජු වගකීමක් නැති බව ය.

10. මීට පිළියමක් වශයෙන් 1980 ශ්‍රී ලංකාව අත්සන් කළ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය අපරානුමත කළ යුතු ය. එවිට 27 වන වගන්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇති වේ.

## මැතිවරණ ක්‍රමය සම්බන්ධව,

1. ස්ථිර මැතිවරණ දින දර්ශනයක් හඳුන්වා දිය යුතු ය.
2. පාර්ලිමේන්තු මැතිවරණය නිශ්චිත දිනක පැවැත්විය යුතු ය.
3. සමානුපාතික හා කේවල ක්‍රමය සහිත මිශ්‍ර මැතිවරණ ක්‍රමය සුදුසු ය.
4. විද්‍යාත්මක පදනම මත (භූ ගෝලීය හා ජනගහණ පදනම මත ) සීමා නිර්ණය කිරීම සිදු කළ යුතුය.
5. මැතිවරණවලදී මහජනතාව ප්‍රතික්ෂේප කරන ලද නියෝජිතයන් ජාතික ලැයිස්තුවෙන් පත් නොකළ යුතුය.
6. පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදීව අපේක්ෂකයන් තෝරා ගැනීමට පක්‍ෂ සාමාජිකයන්ට අවස්ථාව ලබාදිය යුතුය.
7. මැතිවරණවලදී කාන්තා හා තරුණ නියෝජනයට නියමිත කෝටාවක් ස්ථාපිත කළ යුතුය. (කාන්තා - 25%, තරුණ - 25%)
8. දිස්ත්‍රික් පදනම මත තෝරා ගන්නා මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තුව ප්‍රමුඛතාවය මත නම් කළයුතුය. එම පක්ෂයේ ලේකම්වරයාගේ අභිමතයෙන් ඉවත් කළ යුතුය.
9. සියලුම ඡන්ද වල දින ව්‍යවස්ථාපිතව නියම කොට දින දර්ශනයක් සකස් විය යුතුය. දේශපාලන බල අධිකාරයේ කැමැත්තට අනුව ඡන්ද දින නියම කිරීම සිදු නොවිය යුතුය.
10. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදිය යුතුය.
11. මැතිවරණ පොරොන්දු කඩ කරන මන්ත්‍රීවරුන් නැවත කැඳවීමේ අයිතිය ජනතාවට ලබාදිය යුතුය.
12. ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරු තෝරා පත් කර ගැනීම ජනතා මනාපයෙන් සිදු කළ යුතු ය.
13. මැතිවරණ කොමිසම වඩාත් ශක්තිමත් කළ යුතු ය.

# පොදු ගැටලු:

විවිධ පළාත්වල ජීවත්වන පුරවැසියන් මුහුණදෙන ගැටලු කිහිපයක් පහත සඳහන් කොට ඇත. මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් විසඳුම් සෙවීම ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ කාර්යභාරයකි.

## 1. ඉඩම්

ශ්‍රී ලංකාවේ විවිධ පළාත් සිසාරා වන ඉඩම් හා සම්බන්ධ පුරවැසියන්ගේ ඕනෑ එපාකම් විවිධ ය. උතුර හා නැගෙනහිර ප්‍රදේශවල ප්‍රජාව තවමත් හමුදාව ඉඩම් අත්පත් කර ගෙන සිටීම හා සම්බන්ධ දුෂ්කරතාවන්ට මුහුණ දෙන අතර කඳුකරයේ වතුවල වෙසෙන ප්‍රජාවන්ට ඔවුන් ජීවත්වන ඉඩම්වල අයිතිය ලබා දීම තවමත් කළ යුතුව තිබේ.

❖ **ඉඩම් හමුදාව අත්පත් කරගෙන තිබීම.**

**වව්නියාව,මන්නාරම, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය**සහ **මුලතිව්**යන දිස්ත්‍රික්කයන්හිමහජන ඉඩම් බොහෝ ප්‍රමාණයක් හමුදා මූලාස්ථාන ලෙසපවත්වාගෙනයාම නිසා ජනතාව දුෂ්කරතාවලට මුහුණපා සිටිති. අතැමුන්ට ඉඩම් බලපත්‍ර තිබුණ ද හමුදාව ඒවා බලෙන් ම පවරාගෙන ඇත. එසේ ම යුද සමයේ අතැර දමා ඇති ඉඩම්හි කැලෑ වැවී ඇති අතර නැවත මුල් පදිංචි කරුවන් ඒවාට පැමිණි විට වන රක්‍ෂණ දෙපාර්තමේන්තුව එම ඉඩම් වනබිම් ලෙස හඳුන්වා ජනතාවට නිවාස ඉදිකර දීමට ඉඩ නොදී ඇත.**ඌරනි** වැනි නැගෙනහිර පළාතේ බොහෝ ස්ථානවල මේ තත්ත්වය දැකිය හැකි ය. මේ තත්ත්වයන්ට විසඳුම් ලෙස ජනතා ඉඩම් ජනතාවට පැවරිය යුතු ය.

❖ **ඔප්පු හා බලපත්‍ර නොමැතිකම**

විශේෂයෙන් ම උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ජනතාව මෙම ගැටලුවට මුහුණ පා සිටිති. යුද සමයේ පැවති පසුබිම හේතුකොටගෙන ඔප්පු හා බලපත්‍ර අස්ථානගත වීම ද සිදුව ඇත.**වව්නියාව, මන්නාරම, කිලිනොච්චිය, මඩකලපුව සහ ත්‍රිකුණාමලය**වැනි දිස්ත්‍රික්කයන් හි මෙම තත්ත්වය උග්‍ර ලෙස දැකිය හැකිය.

**මධ්‍යම සහ ඌව පළාත්වල** වතුකර ප්‍රදේශන්ගේද මෙම ප්‍රශ්නය ප්‍රබලව හඳුනාගත හැකි ය.**බදුල්ල, මාතලේ, නුවරඑළිය,මොනරාගල සහ ගම්පොල,** වැනි ප්‍රදේශවල ද පරම්පරා උරුමය සහිත ඉඩම්වලට සහ වතු ඉඩම්වලට ඔප්පු හෝ බලපත්‍ර ලබා දී නොමැත.

❖ **ආපදාවන්ට ගොදුරුවීමේ තර්ජනය**

**බදුල්ල, නුවරඑළිය, සහ ගම්පොළ** වැනි ප්‍රදේශවල ඉඩම් නාය යෑමේ තර්ජනයට ගොදුරු වී ඇත. ඇතැම් නාය ගොස් ඇති ඉඩම් වෙනුවට නැවත ඉඩම් ලබා දී නොමැත.

- **අනු පවුල් සඳහා ඉඩම් නොමැතිකම**

මෙම ගැටලුව ඉහත සඳහන් කළ සියලුම ප්‍රදේශයන්වල මෙන් ම දිවයිනේ බොහෝ ප්‍රදේශවල පවතින තත්ත්වයකි.

## 2. නිවාස

දිවයිනමුළුල්ලෙහිම ජනතාව නිවාස හා අදාළ ප්‍රශ්නවලට මුහුණ දී සිටියි. උතුරේ හා නැගෙනහිර නිවාස ප්‍රශ්න නැවත පදිංචි කිරීම වටා කේන්ද්‍රවන අතර මධ්‍යම හා ඌව ප්‍රදේශවල ඉහළම සැලකිල්ල යොමු වන්නේ වතු ප්‍රජාවන් සඳහා තත්ත්වයෙන් බාල නිවාස හා ලයින් කාමර ගැටලුව ගැන ය.

- **නැවත පදිංචි කිරීමේ ගැටලු**

යුද්ධයෙන් විපතට පත් ප්‍රදේශයන්හි ජනයා නැවත පදිංචි කිරිමේ දි ඔවුන්ගේ නිවාසනිසි ආකාරයට පිළිසකර කර නොතිබීම මෙහිදී ප්‍රධාන වේ.උතුරු නැගෙනහිර පළාත්වල බොහෝ දිස්ත්‍රික්කයන්හි මෙකී තත්ත්වය දැකිය හැකි ය.

- **වතු නිවාස ගැටලු**

වතුකර ජනයාගේ ලැයින් නිවාස ගැටලුව**බදුල්ල, නුවරඑළිය, මොරනරාගල, මාතලේ, රත්නපුර, කෑගල්ල සහ දෙනියාය** වැනි ප්‍රදේශවල බහුල වේ. ඉඩකඩ සීමා වීම, විදුලිය, ජලය සහ වැසිකිළි පහසුකම් නොවීම, ලැයින් නිවාස ක්‍රමවේදය ආශ්‍රිතව උග්‍රව පවතී.

- **අනු පවුල්වලට නිවාස නොමැතිකම**

**නුවරඑළිය, බදුල්ල, මොනරාගල,මාතලේ, රත්නපුර, කෑගල්ල සහ දෙනියාය** ආදී කඳුකර ප්‍රදේශය ආශ්‍රිතව ලැයින් නිවාසවල ජීවත්වන ජනයාට මේ ගැටලුව උග්‍ර ලෙස පවතින අතර දිවයිනේ සෙසු ප්‍රදේශවලට අනු පවුල් සඳහා නිවාස නොමැති ගැටලුව දැකිය හැකි ය.

- **පැල්පත් නිවාස**

කොළඹ නරගය ආශ්‍රිතව බොහෝ ස්ථානවල පැල්පත් (මුඩුක්කු නිවාස) නිවාස දැකිය හැකි ය.එසේ ම දිවයිනේ සියලු ම ග්‍රාමීය ප්‍රදේශයන්හි පැල්පත් නිවාස ගැටලුව උග්‍රලෙස පවතී.

## 3. පාරසරික ප්‍රශ්න

රටේ බොහෝ ප්‍රදේශවල විවිධ පාරසරික ගැටලු පවතී. වන විනාශය, ජල පෝෂිත ප්‍රදේශ විනාශ කිරීම, අක්‍රමවත් ලෙස කුණු කසල බැහැර කිරීම මෙහිදී ප්‍රධාන වේ.

- **දිවයිනේ සියලු ම පළාත්වල** වන විනාශය බහුලව හඳුනාගත හැකි ය. එසේ ම කඳුකර ප්‍රදේශයේ අක්‍රමවත් වගාවන් නිසා නාය යෑම් උග්‍ර වී තිබේ.
- රටේ විවිධ කොටස්වල ඇතිවී තිබෙන ප්‍රශ්නයක් වනුයේ ජනතාවට පරිභෝජනය සඳහා සුදුසු ජලයට ප්‍රවේශය නොමැතිකමයි.
- ස්වාභාවික ආපදාවලට සම්බන්ධ පැමිණිලි සාමාන්‍යයෙන් භ්‍රමණය වන්නේ කඩිනම් සහන හා විකල්ප යෝජනා ක්‍රම සැපයීමට පළාත් පාලන ආයතනවල තිබෙන කාර්යක්ෂමතාවේ අඩුව වටා ය. ගංවතුර ඇතිවන විට උතුරු පළාතේ ජනතාවට වන්දි ලබා දීම කරනු නොලැබේ. එසේම ගංවතුර අවස්ථා උත්සන්න වීමේ හේතුව ප්‍රදේශයේ කාණු පද්ධතීන් උතුරා යාමට ඔරොත්තු දීමේ ප්‍රමිතියට නොමැති වීම ය.
- එසේම වන සතුන්ගෙන් එල්ලවන තර්ජන ද විපතට පත් ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ ආරක්ෂාවට හා ජීවිකා වෘත්තීන්ට බරපතල අවහිරයක් බවට පත්ව තිබේ. **අම්පාර, මහියංගනය, අනුරාධපුරය, පොළොන්නරුව, මොනරාගල සහ ත්‍රිකුණාමලය** ආදී දිස්ත්‍රික්වල ජනයාගේ කෘෂිකාර්මික ඉඩම් හා භව බෝග මෙන්ම ඔවුන්ගේ නිවාස ද විනාශ කරන වන අලින්ගෙන් එල්ලවන තර්ජන බහුල වේ.කුඩා ගම් ආරක්ෂිත වැටවලින් ආරක්ෂණය ලබා නැත.

## 4. සෞඛ්‍යය

සෞඛ්‍යය යනු බොහෝ දෙනෙකුට බලපාන මූලික ප්‍රශ්නයකි. මෙය මුහුණුවර කිහිපයකින් බලපා තිබේ.

- **අක්‍රමවත් ලෙස කුණුකසල බැහැර කිරීම නිසා ලෙඩ රෝග ව්‍යාප්තවීම**

  මෙය **බදුල්ල, ගම්පොල, මාතලේ** වැනි ප්‍රදේශවල උග්‍ර ලෙස දැකිය හැකි අතර දිවයිනේ බොහෝ නරගවල මේ තත්ත්වය හඳුනාගත හැකි ය. එසේම **බදුල්ල, මාතලේ සහ හැටන් වැනි කඳුකර** ප්‍රදේශවල ලයින් නිවාස ආශ්‍රිතව ද මෙය හැකිය හැකි ය.

- **සම්පත් නොමැතිකම.**

  මෙහිදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව සම්පත් සේම භෞතික සම්පත් හිඟය ද නොයෙක් ප්‍රදේශවල හඳුනා ගත හැකි ය. වෛද්‍යවරු, කාර්යය මණ්ඩලය හිඟකම මෙන් ම රෝහල්වල රසායනාගාර, බෙහෙත් සහ වෙනත් පහසුකම් නොමැතිකම කැපී පෙනේ.**මාතලේ, හුන්නස්ගිරිය, බදුල්ල, නුවරඑළිය** ආදී කඳුකර ප්‍රදේශවල රෝහල් නොමැතිකම මෙන්ම පවතින රෝහල් නඩත්තු

නොකිරීම සහ වෙනත් පහසුකම් නොතිබීම දැකිය හැකි ය.**කන්තලේ, වව්නියාව, මන්නාරම, කිලිනොච්චිය** ආදී ප්‍රදේශවල උක්ත කාරණය දැකිය හැකි ය.

## 4. කාන්තාගැටලු

### ❖ වැන්දඹු කාන්තාවෝ

අවිවාහක ස්ත්‍රී පවුල් පිළිබඳ ප්‍රශ්නය රට මුළුල්ලේම පවතින බව නිසැක අතර උතුර හා නැගෙනහිර ස්ත්‍රී මූලික කුටුම්බ විශාල සංඛ්‍යාවක් තිබේ. එය විශාල වශයෙන් ගැටුම සමයේ බඳවා ගැනීම් හා සටන් නිසා බොහෝ පුරුෂ ජීවිත අහිමි වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව **කිලිනොච්චිය, මන්නාරම, වව්නියාව, ත්‍රිකුණාමලය, සහ මඩකලපුව** වැනි ප්‍රදේශවල වැන්දඹු කාන්තා ගැටලු හඳුනාගත හැකි ය.

### ❖ ස්ත්‍රී අපයෝජනය

ස්ත්‍රීන් හිරිහැරයට හා අපයෝජනයට ලක් කිරීම හා සම්බන්ධ සිද්ධීන්ගේ සංඛ්‍යාවෙහි වැඩි වීමක් වසර ගණනාවක් පුරා වර්ධනය වී තිබේ.**කඳුකරයේ වතු ආශ්‍රිතව** මෙන් ම **මොනරාගල, අම්පාර** වැනි බොහෝ ප්‍රදේශවල මෙම තතත්වය දැකිය හැකි ය.

### ❖ විදේශගතවීම

මෙය රටපුරා දැකිය හැකි ප්‍රධාන ගැටලුවකි. මෙට නිසි වෘත්තියක් කිරීමට අවස්ථාව නොමැති කමින් සහ දරිද්‍රතාවය හේතුකොට ගෙන ස්ත්‍රීන් බොහෝ ප්‍රමාණයක් විදේශගතවීම හේතුවෙන් ඔවුන්ගේ පවුල් තුළ විවිධ ආර්ථික, සමාජීය ප්‍රශ්න උග්‍ර තත්ත්වයකට පත්ව ඇත.

## 5. ළමා ගැටලු

දරුවන් හා සම්බන්ධ ගැටලු අංශ ගණනාවක් ඔස්සේ ව්‍යාප්තව තිබේ.

### ❖ අධ්‍යාපනය

දිවයිනේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල ඇති ආර්ථික ගැටලු හේතුවෙන් දරුවන් පාසල් අධ්‍යාපනය හමාර කර ඇත. වතුකර ප්‍රදේශන්හි ද තත්ත්වය එසේ ය.**මොනරාගල, අම්පාර,** දිස්ත්‍රික්කයන්හි මෙම තත්ත්වය බහුල ය. එසේම ග්‍රාමීය පාසල්වල ඇති අඩු පහසුකම්, ගුරුවරු හිඟකම, ආදී කාරණා මත සුපෝෂිත අධ්‍යාපනයක් බොහෝ දරුවන්ට නොලැබේ.

### ❖ අපයෝජනය

දරුවන් නොයෙක් ආකාරයෙන් අපයෝජනය වීම හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ද සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන්නකි. මත් වතුරවලට ඇබ්බැහිවීමේ

ප්‍රවණතාවය **වතුකර ප්‍රදේශන්හි** බහුලව දැකිය හැකි ය. එසේ ද දෙමාපියන් විදේශගතවීම හේතුවෙන් පවුලේ වැඩිහිටියන්ගෙන් මෙන්ම අසල්වාසීන්ගෙන් අපයෝජනයට, හිරිහැරවලට භාජනය වීමදිවයිනේ බොහෝ ප්‍රදේශවල දැකිය හැකි පොදු තත්ත්වයකි.

❖ **බාල වයස්කාර විවාහයන්**

මෙම ප්‍රශ්නය නැගෙනහිර ප්‍රදේශයේ විවිධ වාර්ගික සංයුතීන්ගෙන් යුත් ගම් මුලුල්ලේ දැකිය හැකි ය.**අම්පාර, මොනරාගල** වැනි ප්‍රදේශවල බාල වයස් විවාහවල වර්ධනයක් ඇත.**ලාහුගල සහ නාවලඩි** වැනි ග්‍රාමීය ප්‍රදේශවල මෙය බහුල වේ. එසේ ම **කඳුකරයේ වතු ප්‍රදේශන්ගෙන්** ද බාල වයස්කාර විවාහයන් වාර්තා වේ.

## 6. අධ්‍යාපනය

අධ්‍යාපනයට අදාළ ප්‍රශ්න තේමාවන් ගණනාවක් වටා භ්‍රමණය වෙයි. එනම් සීමිත සම්පත් (එය නගරය හා ගම අතර පාසල් සම්පත් අසාධාරණ ලෙස බෙදී යාමට සම්බන්ධ විය හැකි ය), පාසල් ප්‍රවාහන ක්‍රමය සම්බන්ධ ප්‍රශ්න, ගුරු කාර්ය මණ්ඩලයේ අකාර්යක්ෂම බඳවා ගැනීම හා භාෂා බාධක හේතු කොට ගෙන ඉගැන්වීමේ හා ඉගෙන ගැනීමේ දුෂ්කරතාවය යන ඒවා ය.

❖ **සම්පත් හිඟය**

මෙය දිවයිනේ බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල පවතින පොදු ගැටලුවකි. නිසා අධ්‍යාපනයක් සඳහා අවශ්‍ය පහසුකම්, භෞතික සම්පත් හිඟකම සේම ඒ් විෂයන්වලට අදාළ ගුරුවරු හිඟකම ද දැකිය හැකි ය.**නුවරඑළියට, මාතලේ, හැටන්, බදුල්ල** වැනි කඳුකර වතු ප්‍රදේශය වලද මේ තත්ත්වය දැකිය හැකි අතර, **අම්පාර, මොනරාගල, මඩකලපුව, වව්නියාව, යාපනය, කිලිනොච්චිය, මන්නාරම** සහ කයෙට්ස් වැනි දූපත්වල ද මෙම ගැටලුව උග්‍ර ලෙස පවතී.

❖ **ප්‍රවාහන ගැටලු**

බැලූ බැල්මට මෙය අධ්‍යාපනය හා සම්බන්ධ නොවන ගැටලුවක් යැයි පෙනුණ ද බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල පවතින හිඟකම නිසා කලට වේලාවට දරුවන්ට මෙන් ම ගුරුවරුන්ට පාසලට පැමිණීමට නොහැකි වීම නිසා ගැටලු මතුව තිබේ. ඉහත දක් වූ ප්‍රදේශවල මෙන් ම දිවයිනේ සෙසු බොහෝ ප්‍රදේශවල ද මෙම තත්ත්වය පවතී.

**උක්ත සියලු ගැටලු සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විසඳුම් ලබාදීමට අවධානය යොමු විය යුතු ය.**

## වෙනත් යෝජනා:

- ❖ නීතිපති දෙපාර්තුමේන්තුව ස්වාධීන ආයතනයක් නොවේ. එය ජනතාවට සේවය නොකරයි. එය වැටුප් ලබන සිය සේවාදායකයා වන ආණ්ඩුව වෙනුවෙන් ගැතිකම් කරන ආයතනයකි. ඒ පිළිබඳ සැළකිලිමත් විය යුතුය.

- ❖ තරුණයින් ආරක්ෂා කරන ඔවුන්ට නිසි තැන හිමිවන, ඔවුන්ගේ රැකියා ගැටලුවට විසඳුම් සැපයෙන තරුණ ප්‍රඥප්තීන් සකස් විය යුතුය.

- ❖ පාර්ලිමේන්තු මන්ත්‍රී ඇමතිවරුන් මඟින් රැකියා ලබා දීමේ ක්‍රමය වෙනුවට තරඟ විභාග මඟින් රැකියා සඳහා සුදුස්සන් තෝරා ගත යුතුය. තරඟ විභාග ක්‍රමය වඩාත් ප්‍රායෝගික කළ යුතු ය.

- ❖ පාර්ලිමේන්තු මන්ත්‍රීන්, ඇමතිවරුන් ව්‍යවස්ථා සම්පාදනය මූලික කරගත් පාර්ලිමේන්තු කටයුතුවලට පමණක් සීමා විය යුතු අතර වෙනත් සංවර්ධන කටයුතු සඳහා (මාර්ග තැනීම්, පාලම් තැනීම හා ගොඩනැඟිලි ඉදිකිරීම ආදී) මැදිහත් නොවිය යුතු ය. මෙය පළාත් සභා මන්ත්‍රීන් වෙනුවෙන් ද ක්‍රියාත්මක විය යුතු ය.

- ❖ කිසිදු මන්ත්‍රීවරයෙකුට විමධ්‍යගත මුදලින් මුදල් වෙන් නොකළ යුතු අතර මුදල් ලබා දිය යුතු වන්නේ සංවර්ධන කටයුතු සඳහා වගකිය යුතු ආයතනවලට පමණි.

- ❖ පළාත් සභා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පක්ෂ මාරු කරනු ලබන්නේ නම්පනහකට නො අඩු පිරිසක් එසේ පක්ෂ මාරු කළ යුතු ය. එයින් අදහස් කරනු ලබන්නේ පොදු ජාතික වැදගත් කමක් ඇති කාරණයක් පදනම් කරගෙන එසේ පක්ෂ මාරුකිරීම යුක්ති සහගත බවයි.

- ❖ එම සංඛ්‍යාව අඩු වූ අවස්ථාවක ඔවුන්ගේ මන්ත්‍රීධුර අහෝසි කළ යුතු ය. ඉන් අදහස් වන්නේ පටු වාසි හෝ පුද්ගල වුවමනාවන් මත මන්ත්‍රීන් පක්ෂ අත් නොහැරිය යුතු බව ය.

- ❖ පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද අණ පනත්, එකී පනත්වල දක්වා ඇති ආකාරයට ම ක්‍රියාවට නැගිය යුතු අතර එසේ නොවී එම අණ පනත් ක්‍රියාවට නොනැගීමෙන් ජනතාවට සිදුවන අගතිය වැළැක්වීමට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේදී කාලය, මුදල් වැය වන බැවින්, කිසිදු වියදමකින් තොරව කරුණු ඉදිරිපත් කිරීමෙන් පමණක් එම අණ පනත් ක්‍රියාවට නැංවීම සඳහා ස්වාධීන ආයතන ගොඩ නැගිය යුතු ය. උදා: පාරිතෝෂික පනත, 13 වැනි සංශෝධනය, )

- ❖ ජාතිය, ආගම නමින් කිසිදු දේශපාලන පක්ෂයක් ලියාපදිංචි නොකළ යුතු අතර එවැනි පක්ෂ තහනම් කළ යුතු ය. ජාතිය ශ්‍රී ලාංකික විය යුතු අතර කිසිදු රාජ්‍ය පෝරමයකින් ඊට වෙනස් දෙයක් අපේක්ෂා නොකළ යුතු ය.

❖ ජාතිවාදී, ගැටුම් ඇවිලෙන කතා පැවැත්වීම, කවි ගීත ගායනා කිරීම, ඊට අනුබල දෙන කුමන හෝ ක්‍රියාවක් කරන්නෙකුට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් දිය යුතු අතර සියලු ම දේපල රාජ්‍ය සන්තක කළ යුතු ය.

❖ පළාත් සභා හෝ පාර්ලිමේන්තුවට තරග කරන අපේක්ෂකයකුගේ අවම සුදුසුකම ලෙස උසස් පෙළ විභාගය සමත්ව තිබීම අනිවාර්ය අතර පළාත් පාලන ආයතනවලට තරගවදින අපේක්ෂකයින් ස.පෙළ සමත් විය යුතු ය. එම අපේක්ෂකයින් යම් දිනක අධිකරණයෙන් වරදකරුවකු වී තිබේ නම් ඔහුට හෝ ඇයට තරග කළ නොහැකි ය. ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව ද සැළකිලිමත් විය යුතු ය.

❖ ප්‍රදේශීය සභා, පළාත් සභා හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තේරීපත්ව දිවුරුම් දීමට පෙර ඔවුන්ගේ වත්කම් පිළිබඳ දන්විය යුතු අතර වසරින් වසර ඔවුනගේ වත්කම් පරීක්‍ෂා කිරීම සඳහා ස්වාධීන පුද්ගලයන්ගෙන් යුතු විගණන අංශයක් පිහිට විය යුතු ය.

❖ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපති ඇතුළු වගකිව යුතු නිලධාරීන් පත් කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් අනිවාර්යයෙන්ම ව්‍යවස්ථාවේ සඳහාන් විය යුතු ය. ඔවුන් පත් කිරීම දේශපාලනඥයින් මඟින් සිදු නොකළ යුතු අතර ඒ ඒ විෂයන් පිළිබඳ සුවිශේෂී දැනුමක් ඇති පුද්ගලයින්ට වයස් සීමාවෙන් තොරව සේවය කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

❖ පළාත්පාලන, පළාත් සභා සහ පාර්ලිමේන්තුව යන ආයතනවල කාන්තා නියෝජනය වැඩි කළ යුතු ය. එය 35%ක් වත් විය යුතුය.

❖ රැකියා ලබා දීමේ දී දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවටද අවස්ථාව හිමිවන පරිදි ජනගහණයේ ප්‍රතිශතය පිළිබඳ සැළකිලිමත් විය යුතු ය.

❖ රෝහල් ඇතුළු සියලු ම රාජ්‍ය ආයනවල භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව සැළකිලමත් විය යුතු ය.

❖ දෙමළ, ද්‍රවිඩ, දමිළ, ටැමිල් ආදි නොයෙක් ආකාරයට දෙමළ භාෂාව හඳුන් වන අතර නිවැරදි වචනය වන්නේ තමිල්. තමිල් භාෂාව විකෘති නොකළ යුතු ය.

❖ වතුකරයේ ජනයා තවදුරටත් ඉන්දීය දෙමළ ලෙස නොහඳුන්වා ඔවුන්ට ලාංකීයයන් ලෙස හැඳින්වි යුතු ය.

❖ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයන්වලින් බොරු පොරොන්දු ලබා දෙන නිසා ප්‍රතිපත්ති ප්‍රකාශනවලට විරුද්ධව නඩු පැවරීමට අවසර තිබිය යුතු ය. ප්‍රතිපත්ති ප්‍රකාශන සැළකිල්ට ගෙන ඒවා අවලංගු කිරීමට මැතිවරණ කොමසාරිස් කටයුතු කළ යුතු ය.

❖ වතුකරයේ ඉඩම්, නිවාස, අධ්‍යාපන ගැටලු විසඳමින් එම ජනයාගේ සතුට වෙනුවෙන් ඔවුන්ගේ අයිතීන් සුරකින්න කටයුතු කළ යුතු ය. සරළ අර්ථයෙන් ගත් කල 'වත්ත ගමක්' කිරීමට කටයුතු කළ යුතු ය.

❖ වතුකර ජනයාගේ පඩි වැඩි කළ යුතු අතර වතු වෘත්තීය සමිතිවල අරමුදලින් යම් ගණනක් ඔවුන්ගේ පඩියට එකතු විය යුතු ය.

❖ එක් එක් දේශපාල පක්ෂයන්ගේ උවමනාවන් මත වෙනස් නොවන, කුමන ආණ්ඩුව පත් වුවද ක්‍රියාත්මක වන ජාතික ප්‍රතිපත්ති ඇතිවිය යුතු ය.

❖ රජයේ රැකියාවන් සඳහා බඳවාගත්තද ඇතැමුන්ගේ රාජකාරී ස්වභාවය කුමක්දැයි පැහැඳිලි නොවන අතර රජයේ රැකියාවල රාජකාරීන් කුමක්දැයි නිශ්චිතව දැක්විය යුතු ය. (සංවර්ධන නිලධාරීන් ඇට බෙදන, පැළ බෙදන අය ලෙස හැඳින්වීමේ ගැටලුව)

❖ පරිසරය සුරැකෙන සහ මහජන පීඩාවන් ඇති නොවන ආකාරයට ප්‍රබල පරිසර නීති සම්පාදනය කළ යුතු ය. කුණු කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් ජනතාවට ඇතිවන පීඩාවන් අවම කිරීමට හා පාරිසරික හානිය වළක්වා ගැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

❖ විවිධ ආබාධ ඇති විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධව අවධානය යොමු කළ යුතු ය.

❖ අබාධිත පුද්ගලයින් සහිත පවුල්වලට ලබදීමට නියමිත ප්‍රතිපාදන, ආධාර නිසි අයුරින් ලබාදිය යුතු ය.

❖ ප්‍රවාහන සේවයේ දී විශේෂයෙන් ම බස් රථවල 'ආබාධිත අය සඳහා' අසුන් පනවා ඇත්තේ ඉදිරියෙනි. නමුත් බස් රථයට මගීන් නංවා ගනු ලබන්නේ පිටුපස දොරෙනි. එහිදී අබාධිත පුද්ගලයින්ට ඉදිරියට යෑමේදී අපහසුතා ඇති වේ. එකී කාරණා සැළකිල්ලට ගත යුතු ය.

❖ සිංහල, දෙමළ සහ මුස්ලිම් ලෙස පාසල් වෙන් නොකර සියලු පාසල් එකම ජාතියක් ලෙස පැවැත් විය යුතු ය.

❖ දේශපාලනඥයින් වාර්ගික පදනම මත පිහිටා ජනතාවට සේවය කිරීම අත්හැරිය යුතු අතර සියලු පුරවැසියන්ට වාර්ගිකත්වයකින් තොරව සේවය කළ යුතු ය.

❖ රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීමේදී පහළ මට්ටමේ සුළු සේවකයින් පවා රාජ්‍ය ප්‍රතිපත්තියකට අනුව බදවා ගත යුතු ය.

❖ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇති විය යුතු අතර විශ්ව විද්‍යාල ප්‍රවේශ සුදුසුකම වැඩි කළ යුතු ය. රැකියා උත්පාදන අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය.

❖ පනත් සම්මත කිරීමේ දී ආණ්ඩුව ඒ සඳහා මහජන අදහස් ලබා ගත යුතු ය.

❖ සෞඛ්‍ය කොමිසමක් පත් කළ යුතු ය.

❖ පුරවැසි අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් ආදිය පිළිබඳව සමාන්‍ය ජනතාව නොදන්නා බැවින් ඔවුන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු ය.

- කොළනිකරණය පිළිබඳ සැළකිලිමත් විය යුතු ය.

- ප්‍රාදේශීය සභාවේ ගැලරියට ගොස් මහජන අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාව හිමිවිය යුතු ය.

- ප්‍රාදේශීය සභා වඩාත් ශක්තිමත් කොට ග්‍රාමීය වැඩකටයුතු සාර්ථකව සිදු කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

- ග්‍රාම රාජ්‍ය සංකල්පය තවදුරටත් ඉදිරිපත් කළ යුතු ය.

- ඕනෑම නඩුවක් ක්‍රියාත්මක විමේදී එය නවත්වන්නට නීතිපතිට බලයක් ඇති අතර එම බලය ඉවත් කළ යුතු ය.

- මූලික මිනිස් අයිතිවාසිකම් කඩවන අවස්ථාවන්වලදී ඒවෙනුවෙන් පියවර ගැනීමට ක්‍රමවේදයක් තිබිය යුතු ය.

- ගමේ ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන්වලට අදාළ සංවර්ධන ග්‍රාමීය මට්ටමින් ම සකස් කරගත හැකි ක්‍රමවේදයක් සකස් විය යුතු ය.

- මරණයක් වළලා ගැනීමට ස්ථානයක් නොමැතිව සිටින බර්ගර්, මැලේ, අභිකුණ්ඨක ආදී සුළු ජාතීන්ගේ අයිතීන් කෙරෙහි සැළකිලිමත් වියයුතු ය.

- සමාන්‍ය පෙළ සමත් තරුණ තරුණියන්ට රැකියා ලැබෙන ක්‍රමවේදයක් සකස් කළ යුතු ය.

- අලි මිනිස් ගැටුමෙන් මිනිසුන් බොහෝ පීඩා විඳින බැවින් ඒ සඳහා නිසි විසඳුම්, වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කළ යුතු ය.

- රාජ්‍යයේ සේවයේ තොරතුරුදැනගැනීමේ අවස්ථාව හිමිකර දිය යුතු ය.

- බොහෝ රැකියා විරහිත උගත් බුද්ධිමත් තරුණ ප්‍රජාව සිටින බැවින් රාජ්‍ය සේවයේ වයස් මට්ටම සීමා කළ යුතු ය.

- ඇතැම් පාර්ශවයන්ගේ අය වැය යෝජනා පිළි නොගන්නේ නම්, ක්‍රියාත්මක නොකරන්නේ නෙම් ඒ සඳහා හේතු දක්වන නිත්‍යානුකූල ක්‍රමවේදයක් අවශ්‍ය ය.

- කෘෂිකර්ම, අධ්‍යාපන ඇතුළු අනෙකුත් සියලු ම අමාත්‍යාංශයන්හි අමාත්‍යවරුන් වෙනස් වුවද ස්ථිර ව ලේකම්වරු පත් විය යුතු ය.

- ලංකාවේ සියලු ම ප්‍රදේශයන්ට සාධාරණ අයුරින් සම්පත්, ප්‍රතිපාදන වෙන් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු ය.

- ස්වාභාවික සම්පත් ආරක්ෂා කරන වන ජීවි, වන රක්ෂණ, වෙරළ සංරක්ෂණ වැනි වැනි ආයතනවල ක්‍රියා පිළිවෙතෙහි නිරවුල් බවක්, විධිමත් බවක් තිබිය යුතු ය.

- ආහාර ප්‍රමිතිකරණය පිළිබඳ විධිමත් වැඩ පිළිවෙලක් තිබිය යුතු ය.

- සම්පත් සියලු ම දෙනාට සාධාරණව බෙදී යා යුතු නිසා එක් අයකු වගාකරන ඉඩම් ප්‍රාණය සීමා කළ යුතුය. මන්ද නැත්නම් සමාගම් සහ දේපළ හිමියන් විශාල ඉඩම් ප්‍රමාණයක් බුක්ති විඳින අතර දේපළ අහිමි නිර්ධන වැසියන්ට කිසි දෙයක් හිමි නොවේ.

- සත්ව පාලනය කරන ගොවියන්ට, සතුන් ගාල් කිරීමට, තණ කැවීමට නිශ්චිත ස්ථාන තිබිය යුතු අතර ඒ සඳහා නීති සම්පාදනය විය යුතු ය.

- ග්‍රාමීය බීජ, ධාන්‍ය, බෝග රක ගැනීමේ සහ වැඩි දියුණු කරමින් ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතු ය.

- බහු ජාතික සමාගම් විසින් ඖෂධ ජාවාරම් සිදු කිරීම සම්බන්ධයෙන් පියවර ගත යුතු ය.

- සමාජ අර්බුධයන් වර්ධනය වන ආකාරයට මාධ්‍ය භාවිතයේ ප්‍රවණතාවක් ඇති බැවින් එවැනි දෑ වැළැක්වීමට පියවර ගත යුතු ය. විශේෂයෙන් ම ජාතිවාදය ඇවිස්සීම, වාර්ගික කණ්ඩායම් අතර අවිස්වාසය පළුදු කිරීම, සමාජ පරිහානියට යන දෑ සමාජ ගත කිරීම වැනි කාරණාවලට බොහෝ රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය මැදිහත් වන බැවින් ඒ වෙනුවෙන් පියවර ගත යුතු ය.

- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී සිවිල් විද්වත් ප්‍රජාවගේ දායකත්වය ලබා ගත යුතු ය.

- සාමාන්‍ය ජනතාව අතර සංහිඳියාව ගොඩ නැගෙන ආකාරයේ වැඩ පිළිවෙල් සකස් කළ යුතු ය.

- රාජ්‍ය සේවකයින්ට ඇති ගැටලු විසඳීම සඳහා පියවර ගත යුතු ය. රාජ්‍ය සේවකයින් යනු උසස් වැටුප් ලබන මධ්‍යම පාංතික ප්‍රජාවක් යැයි සමාජය හඳුනාගෙන සිටිය ද ඔවුන්ගේ නිවාස, ඉඩම් බලපත්‍ර නොමැති වීමවැනි අංශයන්හි බොහෝ ගැටලු පවති. ඒවා විසඳීමට කටයුතු කළ යුතු ය.

- පුරවැසියාට ඉඩම් බෙදා දීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු ය.
  පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

- ප්‍රයෝජනයකින් තොර ව්‍යාපෘතිවලට රාජ්‍ය මුදල් වැය කිරීම තහනම් කළ යුතු ය.(අම්බුළුවාව වැනි ස්ථාන)

- ඉහළ ම දේශපානඥයාගේ සිට පහළ ම දේශපාලනඥයා දක්වාත් ඉහළ ම රාජ්‍ය නිලධාරියාගේ සිට පහල ම රාජ්‍ය නිලධාරියා දක්වාත් ආයතනවල කෙරෙන දූෂණ වංචා වැළැක්වීමට පියවර ගත යුතු ය. ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමට කටයුතු කළ යුතු ය.

- ❖ වතුවලට අදාළ වතු පාරවල් සහ අනෙකුත් ස්ථාන පළාත් සභාව යටතට පවරාගත යුතු අතර ඒවාට පළාත් සභාව වගකිව යුතු ය.

- ❖ වතුකරේ වතු මට්ටමින් විවිධ ක්ෂේත්‍රයන්හි දක්ෂ නමුත් අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට රැකියා ලබා දිය යුතු ය. (වතුකරයේ බොහෝ අය තේ වගාව, නෙළීම අදී නොයෙක් ක්‍රියා සම්බන්ධව විශේෂඥ දැනුමකින් හෙබි වන අතර නමුත් ඔවුන් අධ්‍යාපන සුදුසුකම් නැති නිසා ඔවුන්ට වතුවල රැකියා අහිමි වේ.)

- ❖ තේ කර්මාන්තය, ධීවර කර්මාන්තය ආදී දේශීය කර්මාන්ත පාසල් අධ්‍යාපනයේ විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතු ය. එවිට මෙරට සමාජය පිළිබඳ දරුවාට පුළුල් අවබෝධයක් ලැබේ.

- ❖ පාසල් අධ්‍යපනයේ දී ආගම් විෂයේ දී වෙන වෙනම ආගම් පිළිබඳ නොඋගන්වා බුද්ධ ධර්මය, හින්දු ධර්මය, කතෝලික ධර්මය හා ඉස්ලාම් ධර්මය එකම පාඩමක ඉගැන්විය යුතු ය. එය සංහිඳියාව ගොඩනැගීම සඳහා බෙහෙවින් ඉවහල් වේ.

- ❖ ජාතික ලැයිස්තුවට ද ඡන්දයක් ලබාදිය හැකි ක්‍රමයක් හඳුන්වා දෙමින් ජාතික ලැයිස්තුවෙන් සිංහල, දෙමළ සහ මුස්ලිම් යන සියලු දෙනාට නියෝජනයක් ලැබීමට සැලැස්විය යුතු ය.

- ❖ වඩාත් නිවැරදි විශ්‍රාම ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය.

- ❖ මුස්ලිම් ප්‍රජාව ඇතැම් ජාතික කටයුතු සඳහා දායක වන ප්‍රමාණය අවම බැවින් ඔවුන් ව දායක කර ගැනීමේ වැඩ පිළිවෙළක් ද හඳුන්වා දිය යුතු ය.

- ❖ අය වැය යෝජනාවලීන් සකස් කිරීමේ දී රටේ පුරවැසියන්ගේ අදහස් හා යෝජනා ලබා ගත යුතු ය.